CPA

CENTRE FOR POLICY ALTERNATIVES

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# නීතීඥ ලක්ෂාන් ඩයස් මහතාට එරෙහිව සිදු කරන ලද තර්ජනාත්මක ප්‍රකාශය සම්බන්ධවයි

***2017 ජූනි 18 දින, කොළඹ:*** ශ්‍රී ලංකාවේ ස්ථාන කිහිපයකම ක්‍රිස්තියානි ආගමික සිද්ධස්ථානවලට එරෙහිව එල්ල වී ඇතැයි කියන ප්‍රහාර මාලාවක් ගැන සඳහන් කරමින් 2017 ජූනි 14 දින නීතීඥ ලක්ෂාන් ඩයස් මහතා විසින් 'අලුත් පාර්ලිමේන්තුව' නම් රූපවාහිනී වැඩසටහනේදී කරන ලද ප්‍රකාශයක් පදනම් කරගෙන අධිකරණ හා බුද්ධශාසන අමාත්‍ය විජේදාස රාජපක්ෂ මහතා විසින් ''එකී ප්‍රකාශය සම්බන්ධයෙන් ලක්ෂාන් ඩයස් මහතා පැය විසිහතරක කාලයක් ඇතුළත සමාව නොගතහොත් ඔහුව නීතීඥ වෘත්තියෙන් නෙරපා දමන'' බවට කළ ප්‍රකාශය සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ බරපතල අවධානය යොමුව තිබේ.

අමාත්‍යවරයෙකු විසින් සිදු කරන ලද මෙකී ප්‍රකාශය දශක ගණනාවක් තිස්සේ මූලික මිනිස් අයිතිවාසිකම් හා පුද්ගල නිදහස උල්ලංඝනයවීම්වලට එරෙහිව කැපවීමෙන් පෙනී සිටි නීතීඥයෙකු සහ මානව හිමිකම් ක්‍රියාකාරියෙකුට එරෙහිව සිදු කරන ලද තර්ජනයක් බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අදහසයි. ඔහු තම වෘත්තීය භූමිකාව තුළ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා නෛතික රාමුව මගින් පුරවැසියන් වෙනුවෙන් ලබා දී ඇති මූලික අයිතිවාසිකම් හා පුද්ගල නිදහස ආරක්ෂා කිරීම වෙනුවෙන් අධිකරණවල පෙනී සිටි අයෙකි. අමාත්‍යවරයා විසින් හිතාමතාම හෝ නොදැනුවත්කම නිසා හෝ සිදු කරන ලද ඉහත ප්‍රකාශය නීතීඥ ඩයස් මහතාගේ ප්‍රකාශය සාවද්‍ය ලෙස ගැනීමක්ද වෙයි. රජයේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙකු විසින් සිදු කරන ලද ඉහත බරපතල ප්‍රකාශය රජය පිළිබඳ විවේචනාත්මක අදහස් දරන කවරෙකුට හෝ විරුද්ධව සිදු කරන ලද තර්ජනයක් මෙන්ම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව සහතික කර ඇති මූලික අයිතිවාසිකම් කඩ කිරීමේ ප්‍රයත්නයක් බවද අපි විශ්වාස කරමු. වත්මන් ආණ්ඩුව පත් වීමට පෙර ලබා දුන් පොරොන්දු මගින් ඉස්මතු වූ ප්‍රජාතාන්ත්‍රික නිදහස හා යහපාලනය විෂයික අපේක්ෂා මෙවැනි ප්‍රකාශ හේතුවෙන් බිඳ වැටීම අපගේ බරපතල කණගාටුවට හේතු වෙයි.

2015 සිට ක්‍රිස්තියානි ආගමික සිද්ධස්ථාන 195 කට එල්ල වී ඇති ප්‍රහාර සම්බන්ධයෙන් ඩයස් මහතා සිදු කර ඇති ප්‍රකාශය National Christian Evangelical Alliance of Sri Lanka විසින් සම්පාදිත ලේඛන මත පදනම් වන්නකි. නීතීඥ ඩයස් මහතා විසින් සිදු කරන ලද එකී ප්‍රකාශය සාවද්‍ය එකක් බව අවධාරණය කරන රාජපක්ෂ අමාත්‍යවරයා වැඩිදුරටත් සඳහන් කරන්නේ තමන් අදාළ ප්‍රකාශය පිළිබඳව අගරදගුරු කාදිනල් මැල්කම් රංජිත් පියතුමන්ගෙන්ද විමසා සිටි අතර කතෝලික පල්ලිවලට එල්ල වී යැයි කියන එකී ප්‍රහාර සම්බන්ධයෙන් තමා කිසිත් නොදන්නා බව එතුමා ප්‍රකාශ කළ බව සඳහන් කරයි. කෙසේ වෙතත්, අමාත්‍යවරයා වෙත අප බලකර සිටින්නේ මෙවැනි කාරණා සම්බන්ධයෙන් සහතික වශයෙන්ම ප්‍රකාශ නිකුත් කිරීමේදී අප රටේ ආගමික ප්‍රජාවන් අතර ඇති බහුත්වවාදී ස්වභාවය සහ විවිධත්වය මැනවින් අවබෝධ කරගෙන, ඊට වඩා සංවේදී ලෙස කටයුතු කළ යුතු බවයි. විශ්වසනීය හා වගකීම් සහගත ලෙස එවැනි කරුණුව නිරවද්‍ය හෝ සාවද්‍ය බව පිළිබඳ ප්‍රකාශ නිකුත් කිරීම කළ යුතු අතර ඒ බව අමාත්‍යවරුන්, ආගමික නායකයන්, රාජ්‍ය නිලධාරීන්, සිවිල් සමාජ නියෝජිතයන් ඇතුළු සියලු දෙනා වෙන එක සේ අදාළ වේ. වගකීම් සහගත ප්‍රකාශ නිකුත් කරමින් යුද්ධයෙන් පීඩාවට පත්ව සිටින සමාජයක නැවතත් බෙදීම් ඇති නොවන හා මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය නොවන ලෙස කටයුතු කිරීම සඳහා ස්වාධීන බව හා අපක්ෂපාතීත්වය අතිශයින් වැදගත් වේ.

අතීතයේ සිටම පත් වූ ආණ්ඩු විසින් ප්‍රකට කරන ලද වැරදි හැසිරීමක් වන මානව හිමිකම් ක්‍රියාධාරයන්ට තර්ජන එල්ල කිරීමේ මෙවැනි සිදුවීම් එවැනි ප්‍රකාශ නිකුත් කිරීමේදී තමන් තොරතුරු ලබා ගන්නා මූලාශ්‍ර පරාසය මීට වඩා පුළුල් කර ගන්නා ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අමාත්‍යවරයාට බල කරයි. එසේම, තමන්ගේ තර්ජනය කිරීමේ අනතුරුව නීතීඥ ඩයස් මහතාට කිසිදු හානියක් සිදු නොවන බව සහතික කිරීමද අමාත්‍යවරයාගේ වගකීමක් බව අපගේ අදහසයි.

සුළුතර ප්‍රජාවන්ට අයත් ආගමික සිද්ධස්ථාන, ව්‍යාපාරික ස්ථාන ආදියට මෑත කාලීනව එල්ල වූ ප්‍රහාර ජාතික මට්ටමින් ප්‍රමුඛතාව දිය යුතු ගැටළුවක් ලෙස සලකා ස්වාධීන පරීක්ෂණ සිදු කොට වැරදිකරුවන් අත්අඩංගුවට ගෙන නීතිය හමුවට පමුණුවන ලෙස අපි ජනාධිපතිතුමාට හා අගමැතිතුමාට නැවත නැවතත් සිහිපත් කරමු. එසේම සියලුම පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ආණ්ඩුවට කැමැත්තක් හා අවශ්‍යතාවක් ඇති බවට **සියලු වාර්ගික ප්‍රජා** අතර විශ්වාසයක් ගොඩ නැගෙන පරිදි කඩිනම් පියවර ගැනීමද ආණ්ඩුව සතු වගකීමකි.